# ලංසු සඳහා ආරාධනය

## පළාත් පාලන, මහාමාර්ග,ග්‍රාම සංවර්ධන, නිවාස, පරිසර හා වනිතා කටයුතු, ග්‍රාමීය යටිතල පහසුකම් හා ඉංජිනේරු ඉදිකිරීම් අමාත්‍යාංශය, උතුරු මැද පළාත

උතුරු මැද පළාත් සභාවේ පළාත් පාලන, මහාමාර්ග,ග්‍රාම සංවර්ධන, නිවාස, පරිසර හා වනිතා කටයුතු, ග්‍රාමීය යටිතල පහසුකම් හා ඉංජිනේරු ඉදිකිරීම් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය වෙනුවෙන් පහත වගුවෙහි සඳහන් ව්‍යාපෘතීන්හි Asphalt සපයා අතුරා සම්පිණ්ඩනය කිරීම සඳහා සුදුසුකම් හා යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ. ලංසු තැබීම ජාතික තරගකාරී ලංසු කැඳවීම (NCB) යටතේ සිදු කරනු ලැබේ.

| අනු අංකය | ප්‍රා. ලේ. කොට්ඨාසය | ව්‍යාපෘති අංකය | ව්‍යාපෘතිය | ඇස්තමේන්තු වටිනාකම (රුපියල් මිලියන) | කොන්ත්‍රාත් කාල සීමාව (දින) | CIDA ශ්‍රේණිය | ලංසු සුරක්ෂණය | | ආපසු නොගෙවන ප්‍රසම්පාදන ලේඛන ගාස්තුව (රුපියල්) |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | වටිනාකම (රුපියල්) | වලංගු විය යුතු කාල සීමාව | |
| 01 | රාජාංගනය | NCP/PRDA/ Asphalt/ 2026/01 | සිරිමාපුර හන්දියේ සිට රාජාංගනය වාන දක්වා මාර්ගය (කි.මී.0+000-3+00) සහ රාජාංගනය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයට පිවිසෙන මාර්ගය(කි. මී. 0. 266) Asphalt සපයා අතුරා සම්පිණ්ඩනය කිරීම. | 59.69 | 30 | C5 හෝ ඉහළ (මහාමාර්ග) | 895,000.00 | 09/10/2026 | 16,600.00 |
| 02 | නැ.නු.ප. | NCP/PRDA/ Asphalt/ 2026/02 | නව බස්නැවතුම්පොළ -මයිල ගස් හන්දිය මාර්ගය(ප්‍රීමන් මාවත) (කි. මී.0+000-0+470) (අදියර II)(Edge Widening) Asphalt සපයා අතුරා සම්පිණ්ඩනය කිරීම. | 18.63 | 30 | C7 හෝ ඉහළ (මහාමාර්ග) | 280,000.00 | 25/09/2026 | 7,000.00 |

1. කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා සුදුසුකම් ලැබීමට, ලංසුකරු අසාදු ලේඛනගත නොවූ අයෙකු විය යුතු අතර, උතුරු මැද පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් හෝ අමාත්‍යාංශය විසින් ඌණ කාර්ය සාධනය හේතු කොටගෙන මීට පෙර ගිවිසුම අවසන් කරන ලද කොන්ත්‍රාත්කරුවකු නොවිය යුතුය. (Should not be Terminated due to the poor performance).
2. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට ලංසු ලේඛනයෙහි 4 පරිච්ඡේදයේ(section 4) සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය. එමෙන්ම Non Collusion Affidavit පත්‍රයද නිසි පරිදි සහතික කර අමුණා තිබිය යුතුයි.
3. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට තාක්ෂණික කාර්ය මණ්ඩලය, මාර්ග අංශයේ වසර 2ක පළපුරුද්දක් ඇති ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ලියාපදිංචි ඉංජිනේරුවෙකු සහ මාර්ග අංශයේ වසර 2 ක පළපුරුද්දක් ඇති NDT තාක්ෂණික නිලධාරියෙකු හෝ මාර්ග අංශයේ වසර 5 ක පළපුරුද්දක් ඇති NCT තාක්ෂණික නිලධාරියෙකුගෙන් සමන්විත විය යුතුය.
4. මේ පිළිබඳව උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට සාමාන්‍යාධිකාරී, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය උ.මැ.ප, අනුරාධපුර. (දු.ක. 025-2222505) වෙතින් වැඩිදුර විස්තර ලබා ගත හැකි අතර, ගාස්තු ගෙවීමකින් තොරව එම කාර්යාලයේදී ලංසු ලේඛන පරීක්ෂා කළ හැකිය.
5. වගුවේ සඳහන් ආපසු නොගෙවන ප්‍රසම්පාදන ලේඛන ගාස්තුව පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය උ.මැ.ප, අනුරාධපුර ගිණුම් අංශයට ගෙවීමෙන් හෝ ලංකා බැංකුව අනුරාධපුර ශාඛාවේ **"සාමාන්‍යාධිකාරී, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය"** නමින් ඇති තිල බැංකු ගිණුම් අංක 0001472049 දරන ගිණුමට බැර කර තැන්පතු පත්‍රිකාව උතුරු මැද පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ ගිණුම් අංශය වෙත භාර දී ලබා ගන්නා කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 2026.05.21 වන දින සිට 2026.06.11 වන දින දක්වා වැඩකරන දිනවල දී පෙ.ව. 9.00 ත් ප.ව.3.00 ත් අතර, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කර සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් ඉංග්‍රීසි බසින් ලබා ගත හැකිය.
6. ලංසු ඉදිරිපත් කිරීමේදී සෑම ලංසුවක්ම පිටපත් දෙකකින් ඉදිරිපත් කළ යුතු අතර, මුල් පිටපත හා අනු පිටපත වශයෙන් වෙන් වෙන්ව කවරවල බහා නැවත එම කවර දෙකම එක් කවරයක බහා එම කවරයේ වම්පස ඉහළ කෙළවර ව්‍යාපෘතියේ නම සහ අංකය පැහැදිලිව සඳහන් කර 2026.06.12 වන දින පෙ.ව. 11.00 ට පෙර **"ලේකම්, පළාත් පාලන, මහාමාර්ග, ග්‍රාම සංවර්ධන, නිවාස, පරිසර හා වනිතා කටයුතු, ග්‍රාමීය යටිතල පහසුකම් හා ඉංජිනේරු ඉදිකිරීම් අමාත්‍යාංශය (උතුරු මැද පළාත), පළමු මහල, පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණය, හරිශ්චන්ද්‍ර මාවත, අනුරාධපුර."** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ ලංසු බහාලුමේ බහාලිය හැකිය. ලංසු භාර ගැනීම අවසන් වූ විගසම ලංසු විවෘත කරනු ලැබේ. එම අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ නියෝජිතයෙකුට සහභාගි විය හැකිය. නියමිත වේලාවට පසුව ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.
7. සෑම ලංසුවක් සමගම එක් එක් ව්‍යාපෘතියට අදාළව ඉහත වගුවේ සඳහන් වටිනාකමට ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතිය ලත් බලපත්‍රලාභී වාණිජ බැංකුවකින් **"ලේකම්, පළාත් පාලන, මහාමාර්ග, ග්‍රාම සංවර්ධන,නිවාස,පරිසර හා වනිතා කටයුතු,ග්‍රාමීය යටිතල පහසුකම් හා ඉංජිනේරු ඉදිකිරීම් අමාත්‍යාංශය(උතුරු මැද පළාත),"** නමින් ප්‍රසම්පාදන ලේඛනවල අන්තර්ගත ආකෘතිය අනුව පමණක් ලබා ගත් ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කළ යුතුය. එසේ නොමැතිනම් පළාත් පාලන, මහාමාර්ග, ග්‍රාම සංවර්ධන, නිවාස,පරිසර හා වනිතා කටයුතු, ග්‍රාමීය යටිතල පහසුකම් හා ඉංජිනේරු ඉදිකිරීම් අමාත්‍යාංශය (උතුරු මැද පළාත) ගිණුම් අංශය වෙත භාර දී ලබා ගන්නා එන්.සී 100 කුවිතාන්සියේ මුල් පිටපත ප්‍රසම්පාදන ලේඛනයට අමුණා ඉදිරිපත් කළ යුතුය. ලංසු සුරක්ෂණය ඉහත වගුවේ සඳහන් දින දක්වා වලංගු විය යුතුය.
8. පූර්ව ප්‍රසම්පාදන රැස්වීම 2026.06.01 වන දින පෙ.ව.11.00 ට "පළාත් පාලන, මහාමාර්ග, ග්‍රාම සංවර්ධන, නිවාස, පරිසර හා වනිතා කටයුතු, ග්‍රාමීය යටිතල පහසුකම් හා ඉංජිනේරු ඉදිකිරීම් අමාත්‍යාංශය (උතුරු මැද පළාත) ,පළමු මහල. පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණය, හරිශ්චන්ද්‍ර මාවත, අනුරාධපුර." යන ස්ථානයේදී පැවැත්වේ.
9. මෙම ප්‍රසම්පාදනය පිළිබඳව අවසාන තීරණය උතුරු මැද පළාත් පාලන, මහාමාර්ග, ග්‍රාම සංවර්ධන,නිවාස,පරිසර හා වනිතා කටයුතු, ග්‍රාමීය යටිතල පහසුකම් හා ඉංජිනේරු ඉදිකිරීම් අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටුව සතු වේ.

**ලේකම්,**
**පළාත් පාලන, මහාමාර්ග, ග්‍රාම සංවර්ධන, නිවාස, පරිසර හා වනිතා කටයුතු,**
**ග්‍රාමීය යටිතල පහසුකම් හා ඉංජිනේරු ඉදිකිරීම් අමාත්‍යාංශය (උතුරු මැද පළාත) ,**
**පළමු මහල, පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණය,**
**හරිශ්චන්ද්‍ර මාවත,**
**අනුරාධපුර."**
**දුරකථන අංකය : 025 - 2222538**

2026/05/21
Page no 22

CamScanner